# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2409/52 – 2024 නොවැම්බර් මස 09 වැනි සෙනසුරාදා – 2024.11.09**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2023/142

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ඩබ්. ලලිත් ප්‍රසන්න මයා, අංක 55/13ඒ, පැඟිරිවත්ත පාර, අල්විස් මාවත, ගංගොඩවිල, නුගේගොඩ.
2. එච්. එම්. ගමගේ මිය, අංක 174/9, බාලිකා නිවස පාර, රුක්මලේ, පන්නිපිටිය.

*හා*

3. කේ. සී. ආරියපාල මයා, අංක 6 ඊ, පිටුම්පේ, පාදුක්ක (ඇතුළු සේවකයින් 39 දෙනා).

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, නිදහස් චතුරස්‍රය, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගාල්ල, කොහොම්බන් වත්ත, අංක 66/2ඒ හි, එච්. ආර්. එල්. සුගතදාස  මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය හරිනි අමරසූරිය,**
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය.

2024 ඔක්තෝබර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2023/142

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ඩබ්. ලලිත් ප්‍රසන්න මයා, අංක 55/13ඒ, පැඟිරිවත්ත පාර, අල්විස් මාවත, ගංගොඩවිල, නුගේගොඩ.

2. එච්. එම්. ගමගේ මිය, අංක 174/9, බාලිකා නිවස පාර, රුක්මලේ, පන්නිපිටිය.

හා

3. කේ. සී. ආරියපාල මයා ඇතුළු සේවකයින් 39 දෙනා, අංක 6 ඒ, පිටුම්පේ, පාදුක්ක

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, නිදහස් චතුරස්‍රය, කොළඹ 07.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ ;**

"ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ අනුමත කාර්යමණ්ඩලය 2018 වර්ෂයේ දී සංශෝධනය කිරීමේ දී JM 1-1 වැටුප් කේතයෙහි පැවති ඇතැම් තනතුරු MM 1-1 වැටුප් කේතයේ පිහිටුවුව ද, ඒ වන විට JM 1-1 සමාන වැටුප් කේතයෙහි සිටි 1 වන ශ්‍රේණියේ කාර්මික සහකාරවරුන්ට (කාර්යභාර නිලධාරීන් ද ඇතුළුව) MM 1-1 වැටුප් කේතය (දරන්නන්ට පමණක් පුද්ගලික වන සේ හෝ)

ලබා නොදීමෙන් ඩබ්. ලලිත් ප්‍රසන්න මයා, එච්. එම්. ගමගේ මිය, කේ. සී. ආරියපාල මයා ඇතුළු ඇමුණුමේ නම් සඳහන් සේවකයින් 39 දෙනාට අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ.''

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

ගොනු අංකය: IR/COM/02/2023/142

ඇමුණුම

| | | | |
|---|---|---|---|
| 01 | ඩබ්ලිව්. ලලිත් ප්‍රසන්න | 21 | ටී. මනම්පේරි |
| 02 | එච්. එම්. ගමගේ | 22 | පී. ඩී. කේ. එල්. කේ. බර්නාඩ් |
| 03 | කේ. සී. ආරියපාල | 23 | ඩබ්ලිව්. එම්. ඒ. විජේසුන්දර |
| 04 | වී. පී. පල්ලියගුරු | 24 | ඩී. එම්. ඩී. ඒ. රෝහිත |
| 05 | ආර්. පී. වී. පත්මසිරි | 25 | ජයසිරි සූරියගේ |
| 06 | එම්. ඒ. එච්. චන්ද්‍රසේකර | 26 | එන්. කේ. ඒ. ආර්. ආර්. සරත්චන්ද්‍ර |
| 07 | යූ. ටී. වික්‍රමරත්න | 27 | ඩී. එම්. කේ. අබේරත්න |
| 08 | එල්. එස්. එච්. ඩබ්ලිව්. ජිනේන්ද්‍ර | 28 | බී. පී. එම්. ඒ. පෙරේරා |
| 09 | එල්. එච්. එම්. යූ. ආර්. හේරත් | 29 | ආර්. එස්. බී. පී. ද සිල්වා |
| 10 | ජේ. ඒ. ජිෆ්රි | 30 | එන්. ඩී. විතාන |
| 11 | ජී. ජී. ඒ. වී. ද සිල්වා | 31 | කේ. ඩී. එස්. වීරක්කොඩි |
| 12 | ඉසෙඩ්. ඒ. සිරාජ් ලුතුෆි | 32 | ජී. එල්. යූ. විමලදාස |
| 13 | එච්. ජේ. අරුණශාන්ත | 33 | එස්. දේවගේ |
| 14 | එල්. පී. මලලනායක | 34 | එච්. ජේ. පී. ජයසිංහ |
| 15 | ඩී. ටී. සී. බී. ප්‍රනාන්දු | 35 | පී. එච්. යූ. ඩී. ඩී. මෙන්ඩිස් |
| 16 | ඒ. ඩබ්ලිව්. විජේසිංහ | 36 | ඩී. එල්. එච්. ජී. රණසිංහ |
| 17 | කේ. ජී. එම්. සිරිවර්ධන | 37 | ඩී. ජයවික්‍රම |
| 18 | එස්. සී. ඒ. විජේතුංග | 38 | කේ. ජේ. කුමාරප්පෙරුම |
| 19 | ඒ. ඩබ්ලිව්. සිරිවර්ධන | 39 | ඩී. එම්. ඩී. අල්විස් |
| 20 | සී. ඊ. සෙනෙවිරත්න | | |

EOG 11 - 0061

මගේ අංකය: IR/COM/04/2023/232

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

සී. ජේ. විජේවීර මහතා, ''සෙවන'', සිරි ආරියවංශ මාවත, වේරදූව, මාතර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මත්තේගොඩ, කුඩමාදූව, ද විලේජ්, අංක 202/බී/61 හි, නීතිඥ විජේසූරිය ආරච්චිගේ ජයවික්‍රම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය හරිනි අමරසූරිය,**
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය.

2024 ඔක්තෝබර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2023/232

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

සී. ජේ. විජේවීර මහතා, ''සෙවන'', සිරි ආරියවංශ මාවත, වේරදූව, මාතර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවය කරන සී. ජේ. විජේවීර මහතාට එම අධිකාරියේ කොට්ඨාස කළමනාකාර තනතුරට පත්කිරීමේ සම්මුඛ පරීක්ෂණයේ දී අසාධාරණයක් සිදුවී තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ.''

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 - 0062

---

මගේ අංකය: IR/COM/01/2023/77.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. ඩබ්. අසංක සම්පත් මයා, මැද වැව, සිප්පුකුලම.
2. ඩබ්. එම්. කපිල විජේකෝන් මයා, කපිරිග්ගම, කලංචිය, අනුරාධපුරය.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, සීදූව, ලියනගේ මුල්ල, එච්පීටී ප්‍රධාන පාර, අංක 31/1 හි, නීතිඥ සී. ඒ. එච්. එම්. විජේරත්න මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ආචාර්ය **හරිනි අමරසූරිය,**
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය.

2024 ඔක්තෝබර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2023/77.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ඩබ්. අසංක සම්පත් මයා, මැද වැව, සිප්පුකුලම.

2. ඩබ්. එම්. කපිල විජේකෝන් මයා, කපිරිග්ගම, කලංචිය, අනුරාධපුරය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ හොරොව්පතාන ඩිපෝවේ සේවය කරන ඩබ්. අසංක සම්පත් මයා සහ ඩබ්. එම්. කපිල විජේකෝන් මයා යන දෙදෙනාට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මානව සම්පත් කළමනාකරණ චක්‍රලේඛ ප්‍රකාරව 2019 වර්ෂය සඳහා ඉතිරි වාර්ෂික නිවාඩු වෙනුවෙන් හිමිකමක් පවතී ද? එසේ හිමිකමක් පවතී නම් එය නොගෙවීම මගින් අසාධාරණයක් සිදුවී තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද? යන්නත් පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 අගෝස්තු මස 09 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 – 0063

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.